මගේ අංකය - SG/Admin/CS/4/ කා.කා.ඉ,
ආයතන අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2025.09.08 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
පළාත් සර්වේයර් ජනරාල්වරුන් / අධ්‍යක්ෂ - මැ.සි.ආ,
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්,
මිනින්දෝරු අධිකාරීවරුන්.

**කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම**

කාර්යාල සේවක සේවයේ නව ව්‍යවස්ථාව හා ඒකාබද්ධ චක්‍රලේඛ 02/2016 අනුව I, II හා III ශ්‍රේණි වල කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන් සඳහා පහත දැක්වෙන කාල සීමාවන්ට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් සියලුම කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| ශ්‍රේණිය | කාල සීමාව |
|---|---|
| I ශ්‍රේණිය | II ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර 05ක් ගතවීමට පෙර නිලධාරීන් පමණි.* |
| II ශ්‍රේණිය | III ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර 03ක් ගතවීමට පෙර නිලධාරීන් පමණි.* |
| III ශ්‍රේණිය | පත් වීමෙන් වසර 03ක් ගතවීමට පෙර නිලධාරීන් පමණි.* |

*උක්ත කාල සීමාවන් තුළ කාර්යාල සේවක සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවූ සේවක මහත්ම මහත්මීන්ටද මේ සඳහා අයදුම් කල හැක.

02. ඒ අනුව, කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථාවට අනුකූලව අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන්, **2025.09.15** දිනට පෙර ඉල්ලුම් කිරීමට දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි. ( ආදර්ශ අයදුම්පත මෙයට අමුණා ඇත. )

අත්/කලේ: වයි.ජී.ඥානතිලක
සර්වේයර් ජනරාල්

කේ.එස්.ඒ.වෙකීකා එල්.සේනාධීර
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්(පාලන) (වැ.බ.)

කේ. එස්. ඒ. වෙකීකා එල්. සේනාධීර,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන) (වැ.බ),
සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක.150, බර්නාඩ් සොයිසා මාවත (කිරුළ පාර),
නාරාහේන්පිට, කොළඹ 05.

09 SEP 2025

**<u>කාර්යාල සේවක සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීම</u>**

1. නම / සේවක අංකය -

2. පත්වීම් දිනය -

3. උසස්වීම ලද දිනය - III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා -

   II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා -

4. වර්තමාන සේවා ස්ථානය -

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට සහභාගී වීමට ඉල්ලුම් කරමි.

දිනය - ඉල්ලුම්කරුගේ අත්සන -

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - අත්සන හා නිල මුද්‍රාව -